## කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

# තේ පර්යේෂණ මණ්ඩලය

# ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

# පරිපාලන නිලධාරී තනතුර (ප්‍රධාන ලිපිකරු)

## ශාන්ත කූම්බ්ස් වතුයාය, තලවකැලේ

ඉහත තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**රැකියා විස්තරය**

තේ කර්මාන්තශාලාවේ, තේ වතුයාය හා කාර්යාලයේ රාජකාරි පාලනය කිරීමේ කටයුතුවලට අදාළ සියලු ලිපි ලේඛන පිළිබඳ කටයුතු කිරීම, අවශ්‍ය තොරතුරු සැපයීම, ගිණුම් සහ ඇස්තමේන්තු පවත්වාගැනීම සහ වතු අධිකාරිගේ උපදෙස් මත දෛනික කාර්යයන්හි නිරත වීම සහ ඇස්තමේන්තු, ප්‍රගති වාර්තා සහ ගිණුම් ආදිය නිසි කලට ඉදිරිපත් කිරීම ඇතුළු වතු කාර්යාලයේ සියලු කාර්යයන්හි වගකීම දැරීම.

**අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද**

ඉංග්‍රීසි සහ අංක ගණිතය / ගණිතය සහිත අ.පො.ස. (සා/පෙ) (වෘත්තියේ පළපුරුද්ද තිබෙන අයට මෙය අදාළ නොවේ.)

ජ්‍යෙෂ්ඨ සහකාර ලිපිකරු වශයෙන් වසර 03 ක අවම පළපුරුද්දක්

**වැටුප් පරිමාණය :** රු. 32,320/- 1,675/- X 40 = රු. 86,645/-

වාර්ෂික වැටුප් වර්ධකය - රු. 1,675/- (පළපුරුද්ද අනුව වැටුප සාකච්ඡා කරගත හැකිය.)

**වයස් සීමාව :**

වයස අවුරුදු 32 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 50 ට වැඩි නොවිය යුතුය. තේ පර්යේෂණ ආයතනයේ වතුයායන්හි සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

තෝරාගත් අයදුම්කරුට තේ පර්යේෂණ ආයතනයේ මෙම තනතුරට අදාළ නියමිත අමතර පහසුකම් සලසනු ඇත.

මෙම තනතුර ස්ථිරය, උප්පැන්න සහතිකයේ පිටපත, විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ අ.පො.ස. සා/පෙ සහ උ/පෙ සහතික පිටපත්, (අයදුම්පත සමග ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.) අදාළ අනෙකුත් අධ්‍යාපන සහතික සහ අනෙකුත් වෘත්තීයමය සහතික සේවා සහතික ආදියෙහි පිටපත් සහ අදාළ ක්ෂේත්‍රය පිළිබඳ ඉල්ලුම්කරුගේ පුහුණුව සහ දැනුම තක්සේරු කළ හැකි, ඥාතීන් නොවන තීරකයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් ද ඇතුළත් කර තම අයදුම්පත ඉදිරිපත් කරන්න.

රජයේ සේවයේ / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල ආදියෙහි සේවය කරන නිලධාරීන්ගේ අයදුම්පත් ඔවුන්ගේ අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. මෙම අවශ්‍යතාවයට අනුකූල නොවීම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හේතුවනු ඇත.

තේ පර්යේෂණ ආයතනයේ www.tri.lk වෙබ් අඩවියට පිවිස ඉල්ලා තිබෙන තොරතුරු ගූගල් ආකෘතියෙන් උඩුගත කර සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය අදාළ උපකාරක ලේඛන ද සමග ඉදිරි කටයුතු සඳහා 2024 මාර්තු 18 වැනි දින හෝ ඊට පෙර පහත අත්සන් කරන අයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් කරන තනතුර ද කවරයේ වම්පස උඩ කෙළවරේ සඳහන් කරන්න.

**අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී,**
**ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය,**
**ශාන්ත කූම්බ්ස්, තලවකැලේ.**